සියලු ම හිමිකම් ඇවිරිණි

**විශාඛා විද්‍යාලය - කොළඹ 05**

**මාර්ගගත තක්සේරුකරණය - පළමු වාරය 2021**

**සිංහල භාෂාව හා සාහිත්‍යය - I පත්‍රය**

**11 ශ්‍රේණිය** **කාලය පැය එකයි.**

**නම/ අංකය** ..................................................................................................................................

❖ **සැලකිය යුතුයිඃ-**

**(i)** **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 කි.**

**(ii)** **අංක (1) සිට (40) තෙක් ප්‍රශ්නවල දී ඇති (1) , (2) , (3) , (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**

**(iii)** **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

❖ අංක (1) සිට (3) තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ** අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

01. තමන්ට බොහෝ කාලයකට පසු **අත්වල හිරි ඇර ගැනීමට** අවස්ථාවක් ලැබුණු බව සොරා අල්ලා ගත් ගම්වැසියෝ පැවසූහ.

(1) දැඩි වෙහෙසක් දැරීමට
(2) රිසි සේ පහර දීම
(3) ව්‍යායාම් කිරීමට අවස්ථාව ලැබීම
(4) අත්වල හිරි වැටීම සුවවීම. (........)

02. **ගජබින්න අලංකාරයෙන්** යුතු බොහෝ පුවත් මාධ්‍යවලින් විකාශනය වේ.

(1) රසවත් ලෙස නිර්මාණය වූ පුවත්
(2) නිර්මාණශීලී පුවත්
(3) එකිනෙකට පරස්පර වූ පුවත්
(4) බොරුවෙන් ම ඔබ දැමූ පුවත් (........)

03. ඇතැමුන්ගේ සිරිත වන්නේ බොහෝ වැඩවලට **වැට බැඳීමට** උත්සහ දැරිම ය.

(1) බාධා කිරීම
(2) විනාශ කිරීම
(3) ශක්තිමත් කිරීම
(4) විවේචනය කිරීම (........)

❖ **අංක (4) සිට (6) තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

04. භාෂාව ශබ්දෝච්චාරණය මූලික කොට ඇතත් ශබ්ද ; භාෂාවේ ............................................ සෑදීමට උපයෝගී වන මෙවලම් පමණි.

(1) සුසංයෝගය
(2) සංයෝගය
(3) සංයුතිය
(4) සංකර්ණය (........)

05. මාර්ටින් වික්‍රමසිංහයන් විසින් බෞද්ධ චින්තන ක්‍රමයේ විශිෂ්ට අංගයක් ලෙස සැලකෙන්නේ ............................................ මතිමතාන්තරවලට වහල් නොවී ස්වාධීනව සිතන්නට ඇති නිදහසයි.

(1) නවීන
(2) ගතානුගතික
(3) තත්කාලීන
(4) අද්‍යතන (........)

06. පැරණි සිංහල ලේඛකයින් තම කෘතීන් නිර්මාණයේදී සංස්කෘත නාට්‍ය ............................................ කළ බව පෙනේ.

(1) පරිශීලනය
(2) පරිග්‍රහණය
(3) පරිශ්‍රමය
(4) පරිශිෂ්ට (........)

07. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) පළුව, ඇතිලිය, සෘණාත්මක, කේලාම්
(2) ව්‍යවර්ථ, සංචරණය, අක්ෂාංශ, කර්කශ
(3) තීක්ෂණ, ද්වන්ද, නිශ්චිත නෛපුණ්‍ය
(4) මුලාව, හරතමුණි, පොළොස්, තණකොළ (........)

08. මාදිලිය, මූලධර්මය, මිත්‍රළ, මෘදුකාංග යන වචනවල පළමු අකුරෙහි අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) ඇලපිල්ල, කෙටි පාපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, ගැටපිල්ල
(2) ඇලපිල්ල, කෙටි පාපිල්ල, ඉස්පිල්ල, ගයනුකිත්ත
(3) ඇලපිල්ල, කෙටි පාපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, රකාරාංශය
(4) ඇලපිල්ල, දීර්ඝ පාපිල්ල , කෙටි ඉස්පිල්ල, ගැටපිල්ල (........)

09. ''රසායන'' යන පදයෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ගය පිළිවෙළින් යෙදුණු වරණය වන්නේ,

(1) මූර්ධජ, දන්තජ, තාලුජ, දන්තජ
(2) මූර්ධජ, තාලුජ, දන්තජ, ඕෂ්ඨජ
(3) තාලුජ, දන්තජ, තාලුජ, දන්තජ
(4) දන්තජ, තාලුජ, මූර්ධජ, දන්තජ (........)

10. අකාරාදී පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පේළිය ඇතුළත් වරණය තෝරන්න.

(1) දිනමිණ, දේවධර්මය, දේපළ, දොඩමලු
(2) තැළුම, තුලනය, තුෂ්ටිජනක, තෙමගුල
(3) ඒකාධිපති, කම්හල, පලතුරු, නරඹන
(4) පුණ්‍යාධාර, පුරාණ, පුනරාගමනය, පුරවරුණ (........)

11. අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) මිනිසෙකු, ඇමතිවරුන්, ඇය, ගංගාවෝ
(2) වංශාධිපතියා, පෞද්ගලික, වැඩිහිටියෙකු, තා
(3) යුෂ්මතුන්, හෙදියක, මා, දරුවන්
(4) වනිතාවෝ, ඇතමෙකු, නිළියන්, අපි (........)

12. ''බල'' ධාතුවට අයත් ඒකවචන, මධ්‍යම පුරුෂ, වර්තමාන කාල, කර්තෘකාරක පදය තෝරන්න.

(1) බලවන්නෙහි
(2) බැලුවෙහි
(3) බලන්නෙහි
(4) බලයි. (........)

13. සමූහාර්ථවාචී පදයක් නොවන්නේ,

(1) පෙළ
(2) ගණ
(3) රළ
(4) කැළ (........)

14. විපුල + ය යන ප්‍රකෘති හා ප්‍රත්‍ය එක් වූ විට සකස් වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) විපුල්‍යය
(2) වෛපුල්‍යය
(3) විපල්‍යයය
(4) වෙපුල්‍යය (........)

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.
(1) කෘදන්ත - කැඩුණු, ගැයුම්, බලන, සිතයි
(2) තද්ධිත - ක්‍රීඩක, හිතකාමී ප්‍රාථමික, ඉඟටි
(3) නිපාත - නිතර, ඉක්බිති,, ඉතිකින්, විසින්
(4) උපසර්ග - අතිමහත්, උපගුරු, සුසැදි, අවියත් (........)

16. පූර්ව ක්‍රියා දෙකක් යෙදී ඇති වාක්‍යය කුමක් ද?
(1) නංගි විලාප දෙමින් මට බැණ වදියි.
(2) දරුවා අඬද්දී අම්මා ඔහු ගී ගයා නළවයි.
(3) පාලකයා සේවකයෙකු වැටුප් දී සේවයෙන් අස්කරයි.
(4) කිරිල්ලිය ගී ගයා නැටුමක් නටා කෑ ගසයි. (........)

- **අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය වඩාත් නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.**

17. ආර්ථික **අවපාතයකට** ලක්ව ඇති බව බොහෝ දෙනාගේ මතයයි.
(1) කඩා වැටීමට
(2) වර්ධනයට
(3) ශීඝ්‍ර වර්ධනයට
(4) පරිහානියකට (........)

18. වර්ෂාවෙන් පසු විශාල **ජල ප්‍රවාහයක්** ගංගාවලින් බැස යනු දක්නට ලැබිණි.
(1) ජලය ප්‍රමාණය
(2) ජල පහර
(3) ජලය රාශියක්
(4) ජලය ස්වල්පයක් (........)

19. විපරිණාමයට පත් වූ කොරෝනා ප්‍රභේද කිහිපයක් ඉන්දියාව, බ්‍රිතාන්‍ය වැනි රටවලින් වාර්තා වේ.
(1) විකෘති වූ
(2) අලුත් වූ
(3) පැතිරුණු
(4) වෙනස් වූ (........)

20. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමඟ බැඳී නොපවත්නා පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.
(1) නාම, ක්‍රියා, නිපාත, උපසර්ග
(2) කෝකිල, ගිරා, පරවි, හංස
(3) බල්ලා, බූරුවා, ඇමීබා, ගවයා
(4) කලියුගය, යුගාන්තය, ගම්පෙරළිය, ලීලා (........)

21. එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) පරිවාර - සහය, ආර්ය - උසස් , අසේව - වෙහෙසව, තැතක් - බොහෝ
(2) යශස් - කීර්ති, සාමග්‍ර්‍යය - සමගිය, ක්ෂුධා - ශ්‍රද්ධාව, මෙරමා - අන්‍යයන්ගේ
(3) පාදප - වෘක්ෂ, තිසර - මොනර, වෙහෙල් - මුව, ලඹ- එල්ලෙන
(4) පුවළ - උසස්, ගිජිඳු - ඇත්රජ, කුට ප්‍රාප්තිය - ජයග්‍රහණය, උදක -අඹ (........)

22. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) පිපුණු - මණිමුක්ත, මිණිමුතු, පුල්, විකසිත
(2) සතුට - ආනන්දය, ප්‍රහර්ෂය, ආහ්ලාදය, ප්‍රමෝදය
(3) ඉර - දිනකර, සූර්යජ, දිනිඳු, රවි
(4) මුහුද - රුවනාර, ජලනිධි සමුද්‍රය, සින්ධු (........)

23. කෘදන්ත පදයක් ඇතුළත් නොවන පද පේළිය තෝරන්න.
(1) සිඟමන්, රැඟුමන්, හැඟුමන්, වියමන්
(2) සිතුම්, දැකුම්, රකුම්, කියුම්
(3) කැපීම්, මැරීම්, පිරීම්, සීරීම්
(4) දිවිලි, ලියවිලි, බැලිලි, මැසිවිලි (........)

24. වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
(1) 'ඇය' යන්නෙහි අනුක්ත පදය 'ඈ' යන්නයි.
(2) 'උවම්' යන්නෙහි 'උ' උපසර්ගය යි.
(3) මිශ්‍ර සිංහල හෝඩියෙහි මුළු ඝෝෂ අක්ෂර ගණන 45 කි.
(4) 'එච්' තුල්‍යාර්ථයේ නිපාත පදයකි. (........)

25. පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත අර්ථාන්විත වාක්‍යය තෝරන්න.
(1) අන්තර්ජාල පහසුකම් නොමැති ප්‍රදේශවල අධ්‍යාපනයට දරුවෝ බොහෝ ගැටලුවලට මුහුණ පා සිටිති.
(2) කොරෝනා මරණ තුළින් රටේ පවතින සෞඛ්‍ය තත්වයේ අපහසුතා මතු වේ.
(3) ජනතාවගේ සමගිය තුළින් ශ්‍රී ලාංකේය ශ්‍රී විභූතිය විද්‍යමාන වේ.
(4) විදෙස් රටවල බොහෝ ඇමතිවරු දේශපාලනය පිළිබඳ මනා පරිචයක් සහිත පුද්ගලයෝ වෙති. (........)

- **අංක 26 - 27 ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.**

26. ලෝකය කෙතරම් දියුණු වුව ද මිනිසාගේ විවේකය අඩුය.
(1) අනේ කාලේ වනේ වාසේ
(2) බල්ලෙක් බිරුවට කන්දක් මිටිවේ ද?
(3) බොත්තම එබුවම ඔක්කොම කෙරෙනව වගේ
(4) අහසට ඉණිමං බඳිනවා වගේ

27. හොඳ දෙයිනුත් නරක සිදු විය හැකි බව,
(1) ගිලී මලෙත් ඇත දත සුද්දෝ
(2) කපුරු මලේ සුවඳිනුත් බඹරු නැහෙනවා
(3) අතදීලා දත නියවනවා වගේ
(4) උණ පුරුකේ දැම්මත් බලු වලිගේ ඇද නැරේ.

28. ගාත්‍රාක්ෂර ලෝප සන්ධියට හා ගාත්‍රාදේශ සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) ගිනියම්, කොළොම්තොට
(2) මුං ඇට, ගංගොඩ
(3) නාට්‍යෝචිත, මාර්ගෝපකරණ
(4) දෙයාකාර, කම්මල

- අංක 29 හා 30 යටතේ දී ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.

29. (1) මහාචාර්ය සෙනරත් පරණවිතානයන් සීගිරි කුරුටු ගී කියවා ඇත.
(2) අමරිකානුවෝ බොහෝ දෙකෙන් මානව හිමිකම් සුරකින්නන් නොවෙති.
(3) ගුරුවරු ශිෂ්‍ය ශිෂ්‍යාවෝ සමග චාරිකාවට සහභාගී වූහ.
(4) පියාණන් දෑ අප වෙනුවෙන් වෙහෙසුණෝය.

30. (1) දෙවඟනන් රංගනයේ යෙදුණහ'යි ශක්‍රයෝ සිතූහ.
(2) කොරෝනා රෝග කාරක විෂබීජ බොහෝ ප්‍රමාණයක් සමාජය තුළ පැතිරෙන්නෝ ය.
(3) ගීත සෘතුවේදී කබායක් පැළඳගත් විදේශකයන් ඇත.
(4) වෛද්‍යවරු හෝ සුළු සේවකයන් රෝහල් පරිශ්‍රයේ සිටිති.

31. ❖ කථිකාචාර්යවරියක ........................................... කටයුතු කළ ඇය විශ්‍රාම ගත්තාය.
❖ ගායකයෝ ....................................... අපි විනෝද වීමු.
❖ කම්කරුවෝ ....................................... මනුෂ්‍යයෝ වෙති.
❖ මව දියණියන් ......................................... ජීවිතයේ සැදෑ සමය ගත කළාය.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

(1) හා, වනාහි, හෙවත්, ලෙස
(2) හා, වනාහි, හෙවත්, ලෙස
(3) ලෙස, හා, වනාහී, හෙවත්
(4) ලෙස, හෙවත්, වනාහි, හා

32. පහත වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"මේ මිනිහා ලෙඩෙක් වෙන්න ඕනෑ"

(1) ඔහු ලෙඩෙක් යැයි කිව හැකිය.
(2) මොහු ලෙඩෙක් විය යුතුයි.
(3) ඔහු ලෙඩෙකි.
(4) මොහු ලෙඩෙක් විය හැකිය.

33. විදේශිකයන්ගේ ඇසින් සුටු සාක්ෂිවලට අමතරව දළදා පෙරහැර පැවැත් වූ බවට සාක්ෂි සපයන කෘතියක් නොවන්නේ කුමක් ද?

(1) මහාවංශය
(2) දළදා සිරිත
(3) බුත්සරණ
(4) දීප වංශය

34. "දුකට කියන කවි සී පද" පද්‍ය ඇතුළත් කාව්‍ය සංග්‍රහය හා එහි කතුවරයා වන්නේ කවුද?

(1) අලුත ගෙනා මනාලිය - පී.බී. සේනානායක
(2) ප්‍රබුද්ධ - මහගමසේකර
(3) සක්වාලිහිණි - මහගම සේකර
(4) ගම අමතකයි - පී.බී. සේනානායක

35. පහත සඳහන් කවියේ හතරවන පදය දැක්වෙන වරණය තෝරන්න.

මැටි හාරන්න බැස ගත්තේ වළ තුළට
මැටි ගොඩ ගන්න කවුරුත් නැත උදවු වට
තනිවම ගොඩ ගතිමි බර අරගෙන කරට
...........................................................................................................................

(1) කතරගමෙහි බල මහිමය පෙන්වන් මෙමට
(2) සුරිඳුනි කදිරපුර ලැබ දෙනු මැන පිහිට
(3) සුරිඳුනි කතරගම අප රැක දෙනු මෙරට
(4) කතරගම දෙවිඳු දිවි රැක දෙන් මෙමට

36. යසෝමා, මහේන්ද්‍ර යන චරිත ඇතුළත් නිර්මාණය වන්නේ,

(1) 'මං තනන්නෝ' ය.
(2) 'සෙංකොට්ටං' ය.
(3) 'සදාමෙලොස පුර දෙරණේ' ය.
(4) 'විජයබාකොල්ලය' ය.

**37.** ''ඒක නෙවෙයි මහාධිකරණතුමනි, ප්‍රශ්නය මේ මවගේ හදවත ඇතුළත බුර බුරා නගින දුක්ගින්දර යි''
මෙහි සඳහන් අර්ථ රසය දනවන රචනා උපක්‍රමය වන්නේ කුමක් ද?

(1) උපමා
(2) රූපක
(3) අනුප්‍රාසය
(4) උත්ප්‍රේක්ෂාලයන්ය.

**38.** ''පෙරදිග ගොරහැඬි රකුසෝ
මගෙ ධ්‍යානය ඇයි කඩන්නේ
නිදා ගන්න  පොරව ගන්න
කළු රෙදි පොට
මොකට ද මේ
තීරුවලට ඉරා දමන්නේ''

මෙම පද්‍යයෙන් කියැවෙන්නේ,

(1) බුද්ධිගලනය ගැන ය.
(2) මරණය ගැන ය.
(3) උදාසීන බව ගැන ය.
(4) හිරු උදාව ගැන ය.

**39.** වී ගොවිතැනේදී 'සොකඩ බැඳීම' යනු,

(1) වගාවට හානි කිරීමට එන සතුන් බිය ගැන්වීමට පඹයන් බැඳීමය
(2) වගාවට හානි කිරීමට එන සතුන්ට ඇතුළු වීමට නොහැකි පරිදි වැටවල් බැඳීම නිසා.
(3) පළිබෝධකයන්ගෙන් වගාව ආරක්ෂා කරගන්නා පරිසර හිතකාමී ක්‍රමයකි.
(4) වගා නොකළ අතහරින ලද පුරන් වූ කුඹුරු අස්වැද්දීමය.

**40.** පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.
**තමන්ගේම අත්දැකීම්, තමන් ඇසුරු කරන අයගේ අත්දැකීම්, මාධ්‍යයෙන් ගන්නා අත්දැකීම් ඔස්සේ ලබාගන්නා අවස්ථා හා සිද්ධි ප්‍රතිනිර්මාණය කරන නිර්මාණකරුවන් අපූර්ව වස්තු නිර්මාණය කරයි. නිර්මාණකරුවෙකු සතු ප්‍රතිභාව, ව්‍යුත්පත්තිය හා සතතාභ්‍යාසය නිර්මාණයේ සාර්ථකත්වයට හේතු වේ.**

(1) නිර්මාණකරුවෙකුට අත්දැකීම් ලැබෙන ක්‍රම තුන වන්නේ තමන්ගේම, තමන් ඇසුරු කරන අයගේ හා මාධ්‍යයක් වන අතර ඔහු සතු හැකියා ද තුනකි.
(2) තමන්ගේ, තමන් ඇසුරු කරන අයගේ හා මාධ්‍යයෙන් ගන්නා අත්දැකීම් ප්‍රතිනිර්මාණය කරන නිර්මාණකරුවා ප්‍රතිභාව, ව්‍යුත්පත්තිය හා සතතාභ්‍යාසයෙන් යුතු වීම නිර්මාණයේ සාර්ථකත්වයට හේතුවකි.
(3) තමන්ගේ, තමන් ඇසුරු කරන අයගේ හා මාධ්‍යයෙන් ගත් අත්දැකීම් තුළින් හා ප්‍රතිභාව, ව්‍යුත්පත්තිය, සතතාභ්‍යාසය තුළින් ප්‍රබල නිර්මාණ බිහි වේ.
(4) නිර්මාණකරුවාට අත්දැකීම් ලැබෙන ක්‍රම ලෙස තමන්ගේ, තමන් ඇසුරු කරන අයගේ, මාධ්‍ය තුළින් යන අංශ තුන දැක්විය හැකි අතර නිර්මාණයක හොඳ නරක තීරණය වන්නේ නිර්මාණකරුවා සතු ප්‍රතිභාව, ව්‍යුත්පත්තිය, සතතාභ්‍යාසය යන අංශ තුන මූලික කොටගෙන බව ප්‍රත්‍යක්ෂ වේ.

සියලු ම හිමිකම් ඇවිරිණි

**විශාඛා විද්‍යාලය - කොළඹ 05**

**මාර්ගගත තක්සේරුකරණය - පළමු වාරය 2021**

**සිංහල භාෂාව හා සාහිත්‍යය - II පත්‍රය**

**11 ශ්‍රේණිය** | **කාලය පැය දෙකයි**

**නම/ අංකය ..........................................................................................................................**

**සැලකිය යුතුයි.**

❖ **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.**

01. **(i) සිට (x) තෙක් ඇති සියලු ම අනු කොටස්වලට කෙටි පිළිතුරු ලියන්න.**

**කිසියම් අනු කොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) (අ) අඝෝෂ තාලුජ අක්ෂරයක් ලියන්න.

..........................................................................................................................

(ආ) කණ්ඨ තාලුජ අක්ෂරයක් ලියන්න.

..........................................................................................................................

(ii) පහත සඳහන් පදවල අර්ථ පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.

අ) බල ආ) බළ

..........................................................................................................................

..........................................................................................................................

(iii) පහත සඳහන් පද විසන්ධි කර ලියන්න.

අ) භාෂෝන්නතිය ............................................ ආ) පුනරුත් ............................................

(iv) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් තද්ධිත පද දෙක උපුටා ලියන්න.

ඇමරිකානු රජය විසින් වෙනත් රටවලට අදියර කිහිපයක් යටතේ ලබාදුන් අතිවිශාල එන්නත් තොග පිළිබඳ දේශීය ආයතන කිහිපයක් විසින් සොයා බලන ලදී.

අ) ................................................ ආ) ................................................

(v) පහත සඳහන් වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර ලියන්න.

(අ) විදේශගත වූ ශ්‍රී ලාංකිකකයෝ පවතින තත්වය හමුවේ මෙරටට පැමිණෙති'යි කෙනෙක් පවසයි.

..........................................................................................................................

(ආ) සේවකයෝ ඇමතිවරු හා සාකච්ඡාවට පැමිණියේ ය.

..........................................................................................................................

(vi) ඔහු කොපමණ **කියතුදු** ඒ පිළිබඳ **නොසැලකූ** ඇය ශාලාවෙන් ඉවතට ගියා ය. යන වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා ප්‍රවර්ගය ලියන්න.

අ) ................................................ ආ) ................................................

(vii) පහත සඳහන් පළමුවැනි වචනය සමග දෙවැනි වචනය නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවැනි වචනය හෝ සකස් කර ලියන්න.

අ) මනුෂ්‍ය ඇසුර ............................................ ආ) කනිෂ්ඨ සිසුවා ............................................

(viii) පහත සඳහන් අදහස්වලට ගැළපෙන ඡත්‍රපදය බැගින් ලියන්න.

අ) පද සැදී ඇති ආකාරය ..................................................

ආ) සැඟවී තිබුණු දෙයක් දැන ගැනීම ..................................................

(ix) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පදය බැගින් ලියන්න.

අ) ආධ්‍යාත්මික .................................................. ආ) ස්වාධීන ..................................................

(x) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

අ) ඇතැම් මිනිස්සු ගිනිගත් නැවෙන් වෙරළට ගොඩ වැදුණු බොහෝ භාණ්ඩ රැස් කරති.

..................................................................................................................................................

ආ) සිදු වූ විනාශය දුටු පරිසරවේදිනියක් ඇමතිවරුන්ට චෝදනා කළාය.

..................................................................................................................................................

*(ලකුණු 20)*

**02.** පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් **එකක්** තෝරාගෙන **වචන 250 කට නොඅඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්ද** යොදන්න. ඔබ (ඊ) රචනය තෝරා ගන්නේ නම් ඒ යටතේ ඇති විස්තරය ආරම්භය ලෙස යොදා ගනිමින් නිර්මාණාත්මක රචනයක් ගොඩනගන්න.

(අ) අපි පරිසරයේ කොටස්කරුවෝ වෙමු. ආදායම, ආහාර හා සුන්දරත්වය ලබා දෙන වෙරළ මුහුදු හා සාගර සම්පත මත අපි ප්‍රධාන වශයෙන් ම යැපෙන්නෙමු. නිතිපතා මහ මුහුදට බැහැර කරන කැළි කසළ, රසායන මුහුදේ ජීවීන්ට අහිතකර තත්ත්වයක් ඇති කර තිබේ. තෙල් විසිරීමක් නිසා සමුද්‍ර පරිසර දූෂණය වීමට ඇති අවදානම දිනෙන් දින වැඩි වෙමින් පවතී. ජාත්‍යන්තර ගණන් බැලීම් අනුව වසරකට පොලිතීන් හා ප්ලාස්ටික් මෙට්‍රික් ටොන් දහයක් පමණ සාගරයට එකතු වේ. මහ පොළොවේ අයිතිය වෙනුවෙන් සටන් කරන අප මුහුදේ අයිතිය වෙනුවෙන් පෙනී සිටින්නේ නැත. අවදානමක් මතු වූ වහාම පිළියම් සොයන ඉක්මන් වැඩපිළිවෙළක අවශ්‍යතාවට අප සියල්ලන් ම පෙළ ගැසිය යුතු කාලය දැන් එළඹ ඇත.

(ආ) ජෛව විවිධත්වය විනාශ වීම වැළැක්වීමට හා වඩා තිරසාර ආර්ථික අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් කෘත්‍රිම පොහොර, පලිබෝධ නාශක හා වල් නාශක ආනයනය කිරීම තහනම් කිරීමට ශ්‍රී ලංකා රජය විසින් පියවර ගෙන ඇත. දශක ගණනාවක් පුරා අධික ලෙස කෘත්‍රිම පොහොර භාවිත කර ඇති ශ්‍රී ලංකාවේ පුළුල් පාරිසරික ගැටලු මෙන් ම සාමාන්‍ය ජනතාව බෝ නොවන රෝග හා නිදන්ගත රෝග ඇති වීමේ වැඩි අවදානමක් ඇත. වහාම ක්‍රියාත්මක වන පරිදි රසායනික පොහොර තහනම් කිරීමෙන් සිදුවන ආර්ථික ප්‍රතිවිපාක ඉතා දරුණු ය. නමුත් සෞඛ්‍ය සම්පන්න හා වඩාත් පාරිසරික වශයෙන් ස්ථිර කාබනික කෘෂිකර්මාන්ත පද්ධතිය සඳහා සංක්‍රමණය වීමට ශ්‍රී ලංකාව ගත් තීරණය හරිත ආර්ථිකයකට මග පාදනු ඇත.

(ඉ) මිනිසත්කමේ උතුම් ගතිගුණ පිළිබිඹු කරන අගනා සාරධර්ම පද්ධතියක් අපට උරුම ය. අතීත ශ්‍රී ලාංකික ජනතාව සමගි සම්පන්නව ලැජ්ජා බය ඇතිව ආගන්තුක සත්කාරයට ළැදිව ජීවත් වූහ. සියලු ජාතීහු එක මවකගේ දරුවන් මෙන් සුහදශීලී බවින් ද එකාවන්ව සිටියහ. ඒ බව ලංකාව පිළිබඳ ලියූ විදේශිකයන්ගේ කෘතිවල ද සඳහන් විය. මෙකී ගුණ ධර්ම පද්ධතිය වැඩිහිටි පරම්පරාවේ අභාවයත් සමග ක්‍රමයෙන් අභාවයට යන දෙයක් බව දැන් දැන් ප්‍රදර්ශනය වේ. වර්තමානයේ කෙමෙන් බැහැර වී යන මේ හර පද්ධතීන් නැවත ගොඩනගා ගුණ ගරුක සමාජයක් බිහිකර ගැනීමට උත්සුක විය යුතු ය.

(ඊ) උසස් පෙළ සමත් වූ පසු තව දුරටත් ඉගෙන ගැනීමට ශක්තියක් මා තුළ නොවීය. පියා නොමැති වීමත් අධික දරිද්‍රතාවත් මගේ ආගතය අවුරන සාධකයන් ය. අපව ජීවත් කරවන්නට මහ පොළොව සමග පොර බදන අම්මාට ශක්තියක් වන්නට මම අධිෂ්ඨාන කර ගත්තෙමි.

*(ලකුණු 25)*

**03. පහත දැක්වෙන ඡේදය වචන 65-75 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.**

කෝෂ ග්‍රන්ථකරණය කවර කාලයක කවර රටෙක, කුමන භාෂාවකින් ආරම්භ වූයේ දැයි නිගමනය කිරීම අපහසු ය. භාෂාවකට වචන එක් රැස් වීමට බලපෑ හේතු රාශියකි. වෙළඳාම සඳහා රටින් රට ගමන් කළ සංචාරකයන්ට ඒ ඒ රටවල විවිධ පළාත්වල භාවිත වූ වචන මතක තබා ගැනීමට අවශ්‍ය වන්නට ඇත. ආවාහ විවාහ ක්‍රමවලින් වෙනත් පළාත්වල මිනිසුන් හා සම්බන්ධකම් ඇති කරගත් අයට ඒ ඒ පළාත්වල භාවිත වූ විශේෂ වචන මතක තබා ගැනීමට අවශ්‍ය වන්නට ඇත. ගද්‍ය පද්‍ය රචනා කළ ලේඛකයන්ට තැනට ගැළපෙන මිහිරි වචන රැස් කර තබා ගැනීමට අවශ්‍ය වන්නට ඇත. වචන රැස් කර ගැනීමේ පුරුද්ද නිසා කෝෂ ග්‍රන්ථ ලිවීම ආරම්භ වූයේ යැයි සිතිය හැකිය. සංස්කෘත බසින් 'නිඝණ්ටු' පාලි බසින් 'නිඝණ්ඩු' යන වචන කෝෂ ග්‍රන්ථවලට ව්‍යවහාර කෙරේ. පාලි සංස්කෘත භාෂාවන්හි පැරණි කෝෂ ග්‍රන්ථ වැඩි වශයෙන්

ලියා ඇත්තේ පද්‍යයෙනි. පොත් පත් සුලබ නොවූ අවධියේ වන පොත් කර මතක තබා ගැනීමට මේවා පද්‍යයෙන් ලියා තබන්නට ඇත. කෝෂ ග්‍රන්ථකරණය සිංහලයට එකතු වූයේ සංස්කෘත, පාලි ග්‍රන්ථ මාර්ගයෙනි. පසු කාලයේ බටහිර සාහිත්‍යයේ ආභාසය නිසා එය වඩා ක්‍රමවත්ව දියුණු විය.

සිංහල භාෂාවේ වචන සඳහා අර්ථ නිරූපණය, ශබ්ද නිෂ්පත්ති, ප්‍රකරණ විභාගාදියෙන් සමුපේත වූ විධිමත් ශබ්දකෝෂයක් සකස් කිරීමේ ඉතිහාසය ක්‍රි.ව. 1884 දක්වා ඈතට දිව යයි. ඉංග්‍රීසි ඔක්ස්පොඩ් ව්‍යුත්පත්ති කෝෂය ගුරු කොට ගෙන සිංහල ශබ්දකෝෂය සකස් කිරීම අරමුණ විය. වසර දෙදහසකට අධික සිංහල භාෂාමය ඉතිහාසයක් ඇති හෙයින් මෙම භාරධූර කාර්යය අරඹන ලද්දේ ක්‍රි.ව. 1925 දී පිහිටුවන ලද පෙර - අපරදිග භාෂා විශාරදයන්ගෙන් යුත් කමිටුවක් මගිනි.

*(ලකුණු 10)*

**04. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

විසිවැනි ශත වර්ෂයේ මැද භාගයේදී යටත් විජිත වාදයෙන් මිදී ස්වාධීන රාජ්‍ය බවට පත් වූ රටවලින් සංගෘහිත ස්වේච්ඡා සංවිධානයක් ලෙස පොදු රාජ්‍ය මණ්ඩලය හැඳින් වේ. දැනට මේ සංවිධානයට අයත් රටවල් ගණනින් 48 ක් ම කලකට පෙර බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත් විජිත වශයෙන් පැවති ඒවා ය. විදේශ රටවල් තම කිරීටයට යටත් කොට ගෙන ඒවා පාලනය කරන රටකට යෙදෙන අධිරාජ්‍යය යන නම යොදා ගැනීමට බ්‍රිතාන්‍යයට තවමත් ඉඩකඩ ඇතත් පොදු රාජය මණ්ඩලය යන නාමයට ගෞරවයක් වශයෙන් තම රාජ්‍යය හැඳින්වීමට යෙදුණු අධිරාජ්‍ය යන කොටස බ්‍රිතාන්‍ය විසින් සිය කැමැත්තෙන් ම ඉවත් කර ගනු ලැබ ඇත. මහා බ්‍රිතාන්‍ය යන නම පවා එරට යොදා නොගන්නේ මේ නිසාය. බ්‍රිතාන්‍ය ඉතිහාසයේ අතිශයින්ම වැදගත් සන්ධිස්ථානයක් ලෙස පිළිගෙන ඇති පොදු ජන නායකයා ලෙස ක්‍රොම්වෙල් පත් කර ගැනීමේ සිද්ධියෙන් පසු පොදු රාජ්‍ය මණ්ඩලය යන පදය බ්‍රිතාන්‍යය යන නාමයට ඈඳිණි. පොදු රාජ්‍ය මණ්ඩලයේ ආරම්භකයා ලෙස ද ක්‍රොම්වෙල් හඳුන්වනු ලැබේ. තෝමස් හොබ්ස්, ජෝන් ලොක් වැනි ඉංග්‍රීසි දාර්ශනිකයෝ සංවිධානය වූ ජන සමාජය යන අර්ථය දීම සඳහා කොමන් වෙල්ත් යන නම යොදති. පොදු රාජ්‍ය මණ්ඩලය නමින් පතළ මේ සංවිධානයේ නායක සමුළුව පැවැත්වෙන්නේ දෙවසරකට වරක් පමණි. ලිඛිත ව්‍යවස්ථාවකින් තොර, සම්මතයට ප්‍රමුඛ ස්ථානය දෙන බ්‍රිතාන්‍ය ආණ්ඩු ක්‍රම ප්‍රතිපත්තිය පොදු රාජ්‍ය මණ්ඩලීය පිළිවෙතෙහි දක්නට ඇති විශේෂ ලක්ෂණයකි. අග්‍රාණ්ඩුකාරවරුන් විසින් බ්‍රිතාන්‍ය රැජින නියෝජනය කරනු ලබන රටවල් තමන්ගේ ම රාජ්‍ය නායකයින් සිටින රටවල් ආදී වශයෙන් පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් කොටස් කීපයකට බෙදේ. සාමාජික රටවල් දෙකක් හෝ කීපයක් අතරේ ආරවුලක් පැන නැගි කල්හි සෙසු සාමාජික රටවල් ඉන් එකද පක්ෂයක්වත් නොගැනීමත් සාමය උදා කර ගැනීම සඳහා හැම රටකට ම උදව් කිරීමත් පොදු රාජ්‍ය මණ්ඩලය පිළිගෙන ඇති විශේෂ ප්‍රතිපත්තියකි. වැසියන්ගේ සුභ සිද්ධිය සඳහා ඒ ඒ රටේ රාජ්‍යයන් ඉටු කරන සේවා, සෙසු සාමාජික රටවල වාසය කරන කෝටි සියයකට අධික ජනකායකගේ සුබ සෙත පිණිස බෙදා හදා ගැනීමට ක්‍රියා කිරීම ද පොදු රාජ්‍ය මණ්ඩලීය අරමුණු අතර වෙයි.

(i) බ්‍රිතාන්‍යය සෙසු රටවල ගෞරවය ගැන සැලකිලිමත් වන රටක් බව දැක්වීමට මෙහි සඳහන් කරුණු දෙකක් ලියන්න.

(ii) මේ පාඨයට අනුව පොදු රාජ්‍ය මණ්ඩලයේ ව්‍යවස්ථාවේ ඇති විශේෂ ලක්ෂණය කුමක් ද?

(iii) අධිරාජ්‍යය යන යෙදුම මේ පාඨය ඇසුරින් නිර්වචනය කරන්න.

(iv) 'පොදු රාජ්‍ය මණ්ඩලය විවිධ තරාතිරම්වල රටවලින් සැදුණකි' යන්නට කරුණු දෙකක් දක්වන්න.

(v) පොදු රාජ්‍ය මණ්ඩලයේ අභිමතාර්ථය එහි සාමාජිකයන්ගේ අන්‍යෝන්‍ය අභිවෘද්ධිය ඇති කිරීම බව පැහැදිලි කිරීමට මෙහි ඇතුළත් කරුණු දෙකක් ඉදිරිපත් කරන්න.

*(ලකුණු 10)*

**05.** ඔබ ප්‍රදේශයේ පවතින නායයාම් තත්තත්වයෙන් ආරක්ෂා වන අන්දම පිළිබඳව ප්‍රදේශවාසීන් දැනුවත් කෙරෙන අත්පත්‍රිකාවක් සකස් කරන්න. ඔබ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් යැයි සිතන්න. දැනට නායයාම් අවදානම් ඇති ස්ථාන, ඒ සඳහා ඔබ විසින් ගත යුතු ක්‍රියාමාර්ග, හදිසි දැනුවත් කිරීම් කළ හැකි ස්ථාන, ප්‍රාදේශීය මට්ටමෙන් සලසා ඇති සහන ආදිය අත් පත්‍රිකාවෙහි ඇතුළත් කළ යුතුය.

*(ලකුණු 15)*

**නැතහොත්**

ඔබට අයිති KN 2538 දරණ පිටකොටුව- පානදුර ධාවනය වන බස් රථය ලීසිං පහසුකම යටතේ මොරටුව ලංකා බැංකු ශාඛාව මාර්ගයෙන් ලබා ගත්තකි. පවතින සංචරණ සීමා තත්වය යටතේ බස් රථ ධාවනය නොවීම නිසා ලීසිං පහසුකම මාසිකව ගෙවීමට නොහැකි බව දන්වමින් ඒ සඳහා සහන කාලයක් ඉල්ලමින් බැංකු කළමනාකරු වෙත යැවෙන ලිපිය සකස් කරන්න. *(ලකුණු 15)*

*සියලු ම හිමිකම් ඇවිරිණි*

විශාඛා විද්‍යාලය - කොළඹ 05

මාර්ගගත තක්සේරුකරණය - පළමු වාරය 2021

සිංහල භාෂාව හා සාහිත්‍යය - III පත්‍රය

11 ශ්‍රේණිය

කාලය පැය දෙකයි.

නම/ අංකය ..........................................................................................................................

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

**01. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනු කොටස්වලට කෙටි උත්තර සපයන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

**(i).** (අ) 'අමාවතුර' කෘතියට මුල් වන්නේ බුදුරජාණන් වහන්සේගේ කවර ගුණයක් ද?

(ආ) බුදුන් වහන්සේ විසින් දමනය කළ 'අමාවතුර' කෘතියෙහි සඳහන් භික්ෂුවක් නම් කරන්න.

**(ii).** (අ) ''සද්ධර්මරත්නාවලියට මූලාශ්‍ර කෘතිය කුමක් ද?

(ආ) පාලි කතාවස්තූන් මුල් කොටගෙන සිංහලෙන් කතා කීමේ කලාව කුමන නමකින් හැඳින්වේ ද?

**(iii).** 'උහු හැරැ -පියුව මැනැවැ හො''

(අ) මෙම ප්‍රකාශය කළේ කවුද?

(ආ) මෙම ප්‍රකාශයට සවන් දෙන්නා වාසය කළ නුවර කුමක් ද?

**(iv).** ''වෙසෙසින් යන නද දිගත පුරායා
අසමින් තුරු හිස රඳන ගිරායා
.....................................................................................
දැමුවෙන් වෙණ නදමය මියුරායා

(අ) මෙම කවියේ තුන්වන පද පේළිය සම්පූර්ණ කරන්න.

(ආ) මෙම කවිය ඇතුළත් කෘතිය ලිවීමට ආරාධනා කළේ කවු ද?

**(v).** ''අවට ලෝකය ඉතා රමණීය වේ. කිසිදු බියක් සිතට නොනැගේ''

(අ) මෙසේ ප්‍රකාශ කරන්නේ කාට ද?

(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් නිර්මාණය කළ තැනැත්තා එහි කතා තේමාව ගනු ලැබුවේ කුමන කෘතියකින් ද?

**(vi).** ''උග්ගසේනනම් සිටු පුත්‍රයාට ශිල්ප දක්වන්ට කියව''

(අ) මෙසේ කියන්නේ කාට ද?

(ආ) මෙම පරකාශය කරන නුවර කුමක් ද?

**(vii).** ''ජාතික රණ දෙරණ මතේ
ගැටී වැටී මළ මොහොතේ
සුන්දර සුරඹුන්ගෙ අතේ
නැළවෙන බව සිතනු පුතේ''

(අ) කවියේ සඳහන් ලෙස සුරඹුන්ගේ අතේ නැළවෙන්නේ කවුද?

(ආ) මෙම කවියේ කතුවරයා වඩාත් ප්‍රසිද්ධ වූයේ කවුරුන් ලෙස ද?

(viii). ''එයා මාස හයකට හිර ගෙදරට එව්වා. මාස හය දැන් පහුවෙලා''

(අ) මෙසේ පවසන්නේ කාට ද?
(ආ) මෙම හිරගෙදර අසල සිටි මහල්ලාගේ ගම් ප්‍රදේශය කොහේ ද?

(ix). (අ) දෙවියන් උදෙසා ගැයුණු ජනකවි වර්ග දෙකක් නම් කරන්න.
(ආ) සුත්ත නිකායට්ඨ කථාව වන පරමත්ත ජෝතිකාවේ එන පාඨයේ කෙතක් රකින සිංහල කාන්තාව කවියක් කීවේ කුමක් තේමා කරගනිමින් ද?

(x). 'උනට වුවමනා වී නම් කෙළවර අස්නක් ගනුව''

(අ) මෙහි උනට යනු කාට ද?
(ආ) මෙසේ ප්‍රකාශ කරන්නේ කාට ද?

**(ලකුණු 20)**

**02. පහත දැක්වෙන ගද්‍ය පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(i). ''කල් යත් යත් ගණනිදු නොදත''

(අ) මෙම නොදැනීමට හේතුව කුමක් ද?
(ආ) අදාළ තැනැත්තා ඒ වෙනුවෙන් කළ දේ කුමක්ද?

(ii). ''මහණෙනි, **<u>මේ දෙකට</u>** ම තිස්ස කළෝ මු තුමූ ම ය''

(අ) ඉරි ඇඳි පදයෙන් අර්ථය ගැන්වෙන තත්වයන් දෙක කවරේ ද?
(ආ) මෙය ප්‍රකාශිත අවස්ථාව කුමක් ද?

(iii). ''ඒ **<u>සස් තෙපුල්</u>** හා සමග **<u>ඩබරයෙන්</u>** ගුළු දියක් සෙයින් දරු නික්මිණි.

(අ) අංකිත පදවල අර්ථ ලියන්න.
(ආ) මෙහි උපමාව හා උපමේය ලියා නම් කරන්න.

(iv). එන්නේ කොහි සිට ද කොතැනකට ද යන්නේ
මම කුමකට ද මා දුටු තැන් විමසන්නේ
මිනිසුන් ගිහින් නිතරම ආපසු එන්නේ
කිමදැයි කියා කිසිවෙකු ඇයි නොසොයන්නේ

(අ) මෙම කවියේ තුන්වන පේළියෙන් කියැවෙන මිනිසුන් නිතරම යන එන තැන් දෙක පිළිවෙළින් දක්වන්න.
(ආ) මෙම කවියේ ඇතුළත් ශබ්ද රසයන් දෙකක් නම් කර කවියෙන්ම ඊට උදාහරණ සපයන්න.

(v). 'ඉදින් නුඹ වහන්සේ අමුත්තක් දන්නා සේක් වී නම් පසිඳුව මැනව''

(අ) මෙය කවුරුන් විසින් කාට කීවේ ද?
(ආ) මින්පසු සිදු වූයේ කුමක් ද?

**(ලකුණු 20)**

03. (අ) කොසොල් රජතුමාගේ චරිතයත්
(ආ) අහිංසකගේ චරිතයත්
ආදර්ශවත් චරිත ලෙස කතුවරයා ඉදිරිපත් කර ඇති ආකාරය එක් කරුණකට දෘෂ්ටාන්ත දෙක බැගින් දෙමින් විමසන්න.

***නැතහොත්*** **(ලකුණු 15)**

ජීවිතයේදී ගනු ලබන
(අ) වැරදි තීරණ හා
(ආ) නිවරදි තීරණ
මත ජීවිතයේ යහපත හෝ අයහපත සිදු වන බව 'උග්ගසේන නම් සිටු පුත්හුගේ වස්තුව' පාඩමෙන් එක් කොටසකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න. **(ලකුණු 15)**

04. (අ) ජීවිතේය විවිධ අවධි නිරූපණය කිරීමත්

(ආ) ප්‍රබල කාව්‍ය අලංකාර යොදා ගැනීමත් හේතුවෙන් 'ගංගාවේ සංගීතය' පැදි පෙළ සාර්ථක වී ඇති අයුරු එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.

***නැතහොත්***

(අ) (අ) ජන කවියේ සුවිශේෂ ලක්ෂණත්

(ආ) උචිත කාව්‍යෝක්ති භාවිතයත්

'හානාහීය පානා අඬහැරෙන් දැනේ' පද්‍ය තුළින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.

**(ලකුණු 15)**

- **5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු ලියන්න.**

05. 'ජාතක කතා සර්වකාලීන අගයකින් යුතුය' සතරකන් මන්ත්‍රණය' පාඩමේ නිර්දිෂ්ට කොටසින් උදාහරණ තුනක් දෙමින් ඉහත කියමන සනාථ කරන්න. **(ලකුණු 10)**

06. 'සමාජ අසාධාරණය නිසා පීඩාවට පත් වන ගැමියන්ගේ අසරණ බව 'බැද්දේගම' නව කතාවේ නිර්දිෂ්ට කොටසින් උදාහරණ තුනක් දෙමින් පහදන්න. **(ලකුණු 10)**

07. ''රට පිළිබඳ ආදරයක් ඇති කරලීමට සාර්ථක කාව්‍යෝපක්‍රම යොදා ගනිමින් 'මුනි සිරිපා සිඹිමින්නේ' පද්‍ය පන්තිය නිර්මාණය කර ඇත. ''උදාහරණ තුනක් දක්වමින් ඉහත කියමන සනාථ කරන්න. **(ලකුණු 10)**